# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/72 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**කොත්මලේ නියම්ගම්දොර පුරාණ රජමහා විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''කොත්මලේ නියම්ගම්දොර පුරාණ රජමහා විහාර පූජාභූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***කොත්මලේ නියම්ගම්දොර පුරාණ රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2010 නොවැම්බර් මස 18 වැනි දින අංක NU/KTM/2010/202 දරන සැලැසුමේ නිරූපිත මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපනේ කෝරළේ සුළු කොට්ඨාසයේ, නියම්ගම්දොර ග්‍රාමයේ, පිහිටි පහත දැක්වෙන I වන කොටස හා II වන කොටසෙහි දක්වා ඇති හෙක්ටයාර් 0.7672 ක විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

*I කොටස*

**කැබලි අංක 1**

| | | |
|---|---|---|
| උතුරට | : | මාර්ගය (මා.සං.අ.), ඇළ සහ පන්සලේ කුඹුර; |
| නැගෙනහිරට | : | ඇළ සහ පන්සලේ කුඹුර, ඇළ සහ පන්සලේ ඉඩම; |
| දකුණට | : | ඇළ සහ මාර්ගය(මා.සං.අ.); |
| බස්නාහිරට | : | මාර්ගය (මා.සං.අ.) සහ ඇළ. |

1A - G 20170 — 50 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*II කොටස*

**කැබලි අංක 2**

| | | |
|---|---|---|
| උතුරට | : | ඇළ; |
| නැගෙනහිරට | : | ඇළ; |
| දකුණට | : | ඇළ; |
| බස්නාහිරට | : | කැබලි අංක 1. |

09 - 495

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.